

A fearless fighter
Putin - a Black -belt Judo expert

දශකයේ අග වනවිටය. පාලන තන්ත්‍රය තුළ ඊළඟ පරම්පරාවේ නව නායකයන් බිහිවීමට පටන් ගැනීමත්, ක්‍රමයෙන් තෙල්මිළ වැඩිවීමට පටන්ගැනීමත් මේ කාලය තුළ ඇරඹිණ. මේ යුගයේදී රුසියානු නායකත්වයට ක්‍රමයෙන් මතු වූ ව්ලැඩිමීර් පුටින් ප්‍රමුඛ නව නායකත්වය යටතේ මේ වෙනස්වීම් ආරම්භ විණ. මෙම වෙනස්වීම් 1999 න් පසු වේගවත්වීම නිසා 2000 ප්‍රථම දශකය තුළ රුසියාව ප්‍රමුඛ එම රුසියානු සමූහාණ්ඩුව ප්‍රබල තත්වයට ආවේය. මේ ලියන්නේ ඒ පිබිදීමේ කථාන්තරයයි.

## ව්ලැඩිමීර් පුටින් (Vladimir Putin) මුල් අවධිය

ව්ලැඩිමීර් පුටින් රුසියාවේ ලෙනින්ග්‍රෑඩ් නගරයේ දී 1952 ඔක්තෝබර් මස සාමාන්‍ය කම්කරු පවුලක උපත ලැබීය. ඔහු සිය නිවස අසල පාසැලක ප්‍රථම අධ්‍යාපනය ලද අතර එහි ද්වීතීය පාසැලක විශ්වවිද්‍යාල ප්‍රවේශය මට්ටම දක්වා උගත්තේය. පාසැල් වියේදී ඔහු විශේෂ දක්ෂතා දැක්වූ බවක් නොපෙනේ. එහෙත් සිය අනාගතය ගැන උනන්දුවෙන් කටයුතු කළ බවට සාක්ෂි ඇත. එනම් ඔහු 1970 දී විශ්වවිද්‍යාල ප්‍රවේශ මට්ටම සමත් වූ විගස ලෙන්න්ග්‍රෑඩ් නගරයේ එදා තිබුණු **KGB** කාර්‍යාලයට ගොස් එහා ප්‍රධානියාම හමුවී තමා **KGB** සේවයට ගන්නා ලෙස ඉල්ලීමක් කිරීමය. එකල **KGB** යනුවෙන් හඳුන්වනු ලැබුයේ සෝවියට් රාජ්‍යයේ ආරක්ෂක කටයුතු අංශයයි. දැන්නම් එය රාජ්‍ය පරිපාලන අංශය බවට පත්ව තිබේ. එවකට **KGB** යේ සේවය කිරීම ප්‍රබල රාජකාරියක් සේ සැලකූ අතර, එය අනාගත නායකයන් බිහිකළ අයතනයක් ලෙස සලකනු ලැබීය.



Putin with former Cuban leader Fidel Castro

එවකට පුටින් ඉතා උනන්දුවෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වූ අතර වඩා ප්‍රිය කළේ විද්‍යා අංශය නොව කලාව හා සාහිත්‍ය අංශයන්ය. එසේම බටහිර සංගීතය සහ වයලීන වාදනය උගත් ඔහු දිගටම සංගීත ප්‍රසංගයන්ද පැවැත් වූ බව කියති. මේ ගැටවරයාගේ අනාගත හැකියා හා දක්ෂතා ඉවෙන් මෙන් හඳුනාගත් **KGB** අංශයේ ප්‍රධානියා තමන්ට වඩා හොඳ තත්වයකින් සිය අනාගත දිවිය ආරම්භ කිරීමට නම් උපාධියක් සම්පූර්ණ කරගන්නවා සමග නැවත ඉල්ලුම්කරන ලෙස උපදෙස් දුන්නේය. එය නිශ්ශබ්දව පිළිගත් පුටින් ලෙනින්ග්‍රෑඩ් විශ්වවිද්‍යාල නීති පීඨයේ උපාධිමාලාවට බැඳී ඉගෙනීම ආරම්භ කළේය.

## KGB යට බැඳීම

පුටින් සිය අභිප්‍රාය වූ **KGB** යට බැඳීම අත්නොහළේය. විටින් විට විපරම් කර බැලීය. උපාධි පාඨමාලාවේ දෙවන වසර අවසානයේදී ඔහු **KGB** යේ ලෙන්න්ග්‍රෑඩ් පරිපාලන අධ්‍යක්ෂක අංශයේ නිලධාරියෙකු වශයෙන් පත්වීම ලැබීය. සිය උපාධි කටයුතු දිගටම කරගෙන යෑමට ද අවසරය ලැබිණ. 1975 දී ඔහු සිය පාඨමාලාව අවසන් කොට නීති උපාධිය ලැබී ය.

පුටින්ට රුසියානු බසට අමතරව ජර්මන්, ඉංග්‍රීසි හා ප්‍රංශ භාෂා වලින් කතාකරන්නට ද, කටයුතු කරන්නට ද හැකියාව තිබිණ. මේ නිසාම ඔහුව විදේශ අංශයට යොමුකරන ලද අතර පරිපාලන අංශවලට පැමිණ කට යුතු කළ විදේශිකයන් හා වැඩ කරන්නට ඔහුට අවස්ථාව ලැබුණි. මෙයින් ලැබුණේ විදේශයන් පිළිබඳ හොඳ දැනුමකි. 1975-1985 දක්වා ණයර් හි විවිධ අංශයන් තුළ ඔහු දින දින ඉහළ නැංගේය.

1980 ගණන් අගදී සෝවියට් ක්‍රමය අර්බුදයට ලක්වීම ඇරඹුණේ සීඝ්‍රයෙනි. එතැන් සිට 1989 අග දක්වා කාලය තුළ පළමුව ගොර්බ ෂොප්ද (Gorbachef) ඉන්පසු එයට පසු යෙල්ට්සින් (Yeltsin) ද ජනාධිපති පදවියේ කටයුතු කළහ. මේ දෙදෙනාගේම නායකත්වය දුර්වල විය. ගෝර්බෂොප්ට පසුව ආ යෙල්ට්සින් යටතේ සෝවියට් දේශය තවත් අර්බුදයට පත් විය. ඒ අවස්ථාව වන විට ලෝක ධනවාදී කඳවුරු සෝවියට් දේශයට එරෙහිව දිගින් දිගටම දශක ගණනාවක් ගෙනගොස් තිබුණු කඩාකප්පල්කාරී යටිකූට්ටු වැඩ සාර්ථක වන ලකුණු පෙනිණ. දුර දිග බලා මේවා වලක්වාලීමට තරම් දේශපාලන ශක්තියක් ඒ නායකයන්ට තිබුණේ නැත.

## සොවියට් ක්‍රමය බිඳවැටීම සහ රුසියානු සමූහාණ්ඩුව බිහිවීම

1989 වනවිට තෙල් මිළ අන්තයටම අඩුවී බැරලය ඇමරිකානු ඩොලර් 10 යට බැස්සේය. ආර්ථික සේම, දේශපාලන අර්බුද උග්‍රවීමත් සමග 1990 දී සෝවියට් ක්‍රමය බිඳවැටිණ. මේ අර්බුද කාරී සමයේ දී පුටින් වැනි පරිපාලන නිලධාරීන්ට වඩ වඩා වගකීම් භාරවූවා සේම ඒ අයගේ ශීඝ්‍ර උසස්වීම් ද සිදුවීය. පුටින් ද ක්‍රමයෙන් රටේ බල කේෂත්‍රය වූ මොස්කව්හි ධූරයන්ට පැමිණියේය. 1996 දී ඔහු ජනාධිපති පාලන අංශයට පත් කෙරෙනු ලැබිණ. 1998 වන විට එම අංශයේ නියෝජ්‍ය නායකයා මෙන්ම සමූහාණ්ඩුවේ ආරක්ෂක අංශයේ ප්‍රධානියා බවටද ඔහු පත්වූයේය. මේ සියළු වගකීම් ඉටුකරන අතරම පුටින් 1997 දී සිය ආචාර්‍ය උපාධියද සම්පූර්ණ කළේය. ලෝකය තුළ රුසියාවට ඇති තැන ප්‍රබලකරලීම සඳහා බලශක්තිය ගන්නා භූමිකාව

**KGB ලොක්කා පුටින්ට දුන් උපදෙස මෙයයි. " දේශපාලනික රැකියාවකට බැඳෙන්නට පළමු විශ්වවිද්‍යාලයට ගොස් ඉගෙනුම ලබා උපාධියක් ගෙන වරෙන්. "**

සහ එය දේශපාලන බලවේගයක් බවට හරවාගත හැකි ආකාරය ඔහු ලියූ නිබන්ධයේ මාතෘකාව විය. මෙසේ ඉදිරියට ආ පුටින් ඊළඟට යෙල්ට්සින් විසින්ම 1999 දී රුසියානු සමූහාණ්ඩුවේ අගමැති වශයෙන් පත්කරනු ලැබූ අතර යෙල්ට්සින්ගෙන් පසු ජනාධිපති ධූරයට පත්විය යුතු පුද්ගලයා වශයෙන්ද නාම යෝජනා කරනු ලැබිණ. එහෙත් ඔහු රටේ ජනතාව අතර නමගිය පුද්ගලයෙකු නොවීය.

## පුටින් ජාතික නායකයෙකු වෙයි.

එයට පසු 1999 ඉතිරි කාලය තුළදී රුසියාවේ සිදුවීම් විසින් පුටින් ජනතාව අතරේ ජාතික මට්ටමේ ජනප්‍රිය පුද්ගලයෙකු බවට ඔසවා තැබිණ. මෙයට පසුබිම සැකසුණේ මෙසේය.

කාලයක් තිස්සේ රුසියානු රජයට විරුද්ධව කැරළිගසමින් සිටි චෙචන් වර්ගයා නැවත වරක් මොස්කව් නගරය ආශ්‍රිත ප්‍රදේශවල ත්‍රස්තවාදී ප්‍රහාර ආරම්භ කළෝය. මොස්කව් නගරයේ ජනවාස ගොඩනැගිලි වල ඔවුන් විසින් සිදුකරන ලද බෝම්බ පිපිරවීම් නිසා සිය ගණන් ජනයා මරුමුවට පත්වීය. දරුණු තුවාලා ලැබූහ අසරණ වූහ.

මෙතැනදී ක්‍රියාත්මක වූ අගමැති පුටින් එම කැරළිකරුවන් අල්ලා වහාම රුසියාවට බාරදෙන ලෙස් චෙච්නියා ප්‍රාන්ත රාජ්‍යයේ ජනාධිපත් වූ මැෂ්කඩෝප්ට අණකළ අතර එසේ නොකළහොත් එහි ආදීනව බාරගත යුතු බවට නිවේදනයකළේය. එහෙත් එය සිදු නොවූ කල පුටින් කළේ චෙච්නියාවේ ගම්, නියම්ගම් සේම, චෙචන් අගනුවර වූ ග්‍රොස්කි වලටද බෝම්බ දමා සමතලා කර දැමීමයි. මේ ක්‍රියාවෙන් පසු පුටින්ගේ හැකියාව හඳුනාගත් රුසියානු ජනතාව අතර ඔහු නියමවීරයා බවට පත්වීය. පසුව යෙල්ට්සින්ගේ කාල සීමාව අවසන් වනවිට 2000 මාර්තුවල පැවැත්වූ ජනපතිවරණයේද පුටින් 53% ක් ඡන්ද ලබමින් රුසියාවේ ජනපති ධූරයට පත් වීය.

## රුසියාවට හොඳ දසාවක්

1999 අග භාගයේ සිට ලෝක තෙල් මිළ යළිත් ඉහළ යෑම ඇරඹිණ. එය රුසියා-වට හොඳ දසාවක් ලැබුවා වැනි වීය. කාලයක් තිස්සේ අවශ්‍ය පදනම වැටී තිබුණා සේම සිය රට ගැන තිබුණු දේශහිතෛෂී භාවයද, අවංකවම ජනතා දියුණුවට කටයුතුකිරීම ආදිය නිසාද පුටින් ඉදිරියට තැබූ හැම පියවරක්ම සාර්ථකවිය. මෙතැන් සිට 2003 දක්වාද, එයට පසු 2007 දක්වා දෙවන වාරයක්ද ජනපති වූ පුටින් පුරා වසර 8 ක් ඒ තනතුර හෙබවීය. සෝවියට් දේශයේ බිඳවැටීම සමග දුර්වලව තිබුණු රුසියා-නු සමූහාණ්ඩුව ලෝකයේ නැවත ප්‍රබල තත්වයකට මේ කාලය තුළදී පැමිණියේය.

## තෙලේ බලේ දැනවූ - ගෑස්ප්‍රොම් Gazprom

රුසියාව ලෝකයේ තෙල් ඉල්ලම් ඇති විශාල රටක් බව කීවෙමු. විශේෂයෙන් සයිබීරියා ප්‍රදේශයේ මෙන්ම රුසියානු සමූහාණ්ඩුවට අයත් මධ්‍යම ආසියානු රටවල් රාශියක තෙල් සහ ගෑස් ඉල්ලම් සියල්ල එකතු වී සෑදී ඇති ප්‍රධානතම තෙල් සංවිධානය රුසියාවේ ගෑස්ප්‍රොම් ආයතනය වෙයි. ලෝකයේ විශාලම ගෑස් බලශක්තිය වන තෙල් ඉන්ධන ආදිය අතින් ලොව ප්‍රබලම සංවිධානය එයයි. සිය ආචාර්‍ය උපාධියට පවා මෙම විෂය පිළිබඳ හැදෑරූ පුටින් අන් කාටත් වඩා මෙහි වටිනාකම හොඳින් දනියි.


සෝවියට් ක්‍රමය පිරිහීම සමග ගෑස්ප්‍රොම් ආයතනයද පිරිහීමකට පත්ව සිටියේය. නමුත් එය බිඳවැටීම සමග පෞද්ගලික අංශයේ වෙනත් අතකට සූරාකෑම පටන්ගෙන තිබුණි පුටින් බලයට ඒමත් සමග 2000-2003 කාලයේදී ඒ දුර්වලතා තුරන්කොට සුද්ධකොට ප්‍රතිසංවිධානය කරමින් ගෑස්ප්‍රොම් දියුණුකිරීම ආරම්භ විය. පුටින් විස්වාසවන්ත විශේෂඥයින් දෙදෙනෙකු ප්‍රධානීන් ලෙස පත් කළේය.

ක්‍රමයෙන් මුළු යුරෝපයටම කාර්මික කටයුතු සහ ජන අවශ්‍යතාවන් සඳහා ගෑස් හා ඉන්ධන බලය සැපයීම අද ගෑස්ප්‍රොම් මගින් කෙරෙයි. මධ්‍යම ආසියාවේ සිට බටහිර යුරෝපය දක්වාම හැම අතකටම විහිදෙන කිලෝමීටර් 200000 පමණ දික්වූ පයිප්ප මගින් මේවා බෙදාහරිනු ලබයි. එම ගෑස් ආකර වලින් එන ස්වාභාවික ගෑස් හොඳම ඉන්ධන බලය ලෙස සැලකේ. මේ වායු ගෑස් සීතල කිරීමෙන් හා පීඩනයෙන් ද්‍රවගෑස් (Liquid gas) බවට හරවා නල මගින් බෙදාහැරේ. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය බටහිරින් ලබා ගනිමින් ගෑස්ප්‍රොම් ඉදිරියට යයි. එසේම ඉන්ධන ලබාගැන්ම සඳහා ජර්මණිය, ප්‍රංශය, ඉතාලිය නෝර්වේ වැනි රටවල් රුසියාව සමග සහයෝගයෙන් කටයුතු කරයි. එදා බටහිර දැහලූයේ මධ්‍යම ආසියාවේ තෙල් ඉල්ලම් වලට තට්ටු කිරීමට ය. එහෙත් එය හරිගියේ නැත.

නොබෝ කලකට ඉහත වැටී සිටි රුසියාව පුටින් යටතේ අද යළිත් ඉමහත් පිබිදීමක් ලබා සිටී. ආර්ථික වශයෙන්ද, දේශපාලන වශයෙන්ද රුසියාව යළිත් ලෝකයේ ප්‍රබල තත්වයට පත්වෙමින් පවතී. මෙයට ප්‍රධාන හේතුව වන්නේ පුටින් වැනි දේශ හිතෛෂී නායකයින් රටේ බලය ඉදිරියට ගෙන යමින් කටයුතු කිරීමය. පුටින් වරක් කීවේ ඔහුගේ වැයම රුසියාව ස්ථාවරව ලෝකයේ ප්‍රබල තැනක ස්ථාපනය කිරීම බවය. සැබැවින්ම ඔහු අද එය ඉටුකර ඇති බව අපි දකිමු.

♦ **වකුල ගුණපාල Essex UK**

## ලේඛකයා ගැන



*වකුල ගුණපාල කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණික අධ්‍යන අංශයේ හිටපු අංශ ප්‍රධානී වෙයි. පසුව ඔහු නයිජීරියාවේ මයිගුරී විශ්වවිද්‍යාලයේ සේවයට බැඳුණු අතර මැතක එංගලන්තයේ උසස් විද්‍යාල කීපයකම ගණිත හා භෞතික විද්‍යා උපදේශකවරයෙකු ලෙස වසර ගණනාවක සේවයෙන් පසු දැන් විශ්‍රාම ලබා සිටී.*

